Nestlé Good food, Good life

මාධ්‍ය නිවේදනය

2023 සැප්තැම්බර් 26, කොළඹ

# නෙස්ලේ නෙස්ටොමෝල්ට්, 2023 පාපැදි ශූරතාවය බලගන්වයි

නෙස්ලේ නෙස්ටොමෝල්ට් 2023 පාපැදි ශූරතාවය, දක්ෂ පාපැදිකරුවන් 650 කගේ සහභාගීත්වයෙන්, සැප්තැම්බර් 24 වැනිදා කොළඹ විහාරමහාදේවී උද්‍යාන පරිශ්‍රයේදී සාර්ථකව නිමාවිය.

බොහෝ දෙනෙක් අපේක්ෂාවෙන් බලා සිටි මෙම තරඟාවලිය ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යංශයේ මඟපෙන්වීම යටතේ ශ්‍රී ලංකා පාපැදි සම්මේලනය විසින් සංවිධානය කරන ලද්දේ නෙස්ලේ නෙස්ටොමෝල්ට් සාදර අනුග්‍රහකත්වයෙනි. නෙස්ලේ නෙස්ටොමෝල්ට් අභිලාෂය වන 'අරමුණු බලගැන්වීම' ශාක්ෂාත් කරමින්, ශ්‍රී ලාංකිකයින් හට නීරෝගීමත් ක්‍රියාශීලී ජීවන රටාවකට මඟපෙන්වමින්, 'Good food, Good life' තේමාව කරගත් නෙස්ලේ ලංකා සමාගම, මෙම පාපැදි තරඟාවලියට අඛණ්ඩව තුන්වැනි වසරටත් අනුග්‍රහය දැක්වූයේය.

"ශ්‍රී ලාංකිකයින්ගේ උදෑසන පළමු පානය වන නෙස්ලේ නෙස්ටොමෝල්ට් වසර 60කටත් අධික කාලයක් පුරා විවිධ වැඩසටහන් හරහා ශ්‍රී ලාංකිකයින් බලගැන්වීමට සමත්වුවා. නෙස්ලේ නෙස්ටොමෝල්ට් පාපැදි ශූරතාවය ඊට කදිම උදාහරණයකි. ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යංශයේ මඟපෙන්වීම යටතේ ශ්‍රී ලංකා පාපැදි සම්මේලනය සමඟ එක්ව අපේ රටේ සිටින අති දක්ෂ පාපැදි ධාවකයින්ට තම දක්ෂතා පෙන්වීමටත්, ඔවුන්ගේ වෘත්තීමය පාපැදි ධාවනය ඉහළ නංවාලීමටත්, සියලු ශ්‍රී ලාංකිකයින්ට ක්‍රියාශීලී ජීවන රටාවක් පවත්වාගැනීමේ වැදගත්කම පෙන්වා දීමටත් මෙම අවස්ථාව බෙහෙවින් උපකාරී විය", යනුවෙන් නෙස්ලේ අධ්‍යක්ෂ (කිරි ආහාර අංශය) රුවන් වැලිකල මහතා ප්‍රකාශ කළේය.

ශ්‍රී ලංකාවේ වෘත්තීමය පාපැදි ධාවන ක්ෂේත්‍රයට මෙම පාපැදි ශූරතාවය තුළින් ලැබෙන පිටිවහල හේතුවෙන් ගෙවුණු වසර තුන අතරතුර ඊට ලැබෙන අවධානය ද ශීඝ්‍රයෙන් වර්ධනය වී තිබේ. ප්‍රේක්ෂක දිරිගැන්වීම මධ්‍යයයේ, විශේෂිත ධාවන පථ කිහිපයක තරඟ ඉසව් අටක් විහාරමහාදේවී උද්‍යාන පරිශ්‍රය අවට පැවැත්විණි.

තරග ප්‍රතිඵල :

**පිරිමි- කණිෂ්ඨ (රේසිං)**

1. S.S.H මැකේ
2. M. A. H. S. සමරවීර
3. M. D. D. පෙරේරා

**පිරිමි - පාසල් (ස්ටැන්ඩර්ඩ්)**

1. G. K. හිරුණ සංජන
2. I. B. පවන්සිරි ද සිල්වා
3. S. A. දේශාන් ද සිල්වා

කාන්තා- පාසල් (ස්ටෑන්ඩර්ඩ්)
1. ජනුජා සුමුදුනී
2. H. S. සෙව්වන්දි
3. මෙධානිකා රාජපක්ෂ

පිරිමි- අවුරුදු 23 පහළ (රේසිං)
1. A. P. D. S. පෙරේරා
2. කල්ප රසංජන
3. චමත් අභිෂේක

පිරිමි - විශිෂ්ට (රේසිං)
1. A. හෙට්ටිආරච්චි
2. H.W.M. සඳරුවන් පින්ටෝ
3. ජනක හේමන්ත

කාන්තා - විශිෂ්ට (රේසිං)
1. M. ප්‍රනාන්දු
2. S. ප්‍රියදර්ශනී
3. W.A.A. සදමිණි

පිරිමි- විවෘත (ස්ටෑන්ඩර්ඩ්)
1. U. S. S. ප්‍රනාන්දු
2. T. මදුශාන්
3. D. K. S. V. ප්‍රනාන්දු

මාස්ටර්-50ට වැඩි (රේසිං)
1. L.S. ද සිල්වා
2. M. M. මොහිදීන්
3. S. H. කමල් පාලිත

1906 වසරේ ශ්‍රී ලංකාව තුළ සිය මෙහෙයුම් ආරම්භ කළ නෙස්ලේ ලංකා සමාගම වසර 115කට අධික කාලයක් පුරා ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත තුළට සමීප වී ඇත. ශ්‍රී ලංකාව තුළ අලෙවි කරන නෙස්ලේ නිෂ්පාදනවලින් 90%කට වැඩි ප්‍රමාණයක් කුරුණෑගල පිහිටි නෙස්ලේ කර්මාන්තශාලාවේ දැඩි ආහාර සුරක්ෂිතතා සහ ගුණාත්මක ප්‍රමිතීන් මත නිපදවනු ලබයි. නෙස්ලේහි ප්‍රමුඛතම සන්නාමය වන නෙස්ටොමෝල්ට්, වසර 60කට වැඩි කාලයක් පුරා ශ්‍රී ලාංකික පවුල්වල විශ්වාසය සහ ආදරය දිනූ නිෂ්පාදනයකි. ශ්‍රී ලංකාවේ පමණක් නිෂ්පාදනය කෙරෙන නෙස්ටොමෝල්ට්, මෝල්ට් බාර්ලි සහ කිරි යහගුණයෙන් ද, අත්‍යාවශ්‍ය පෝෂක වලින් ද සරු ශ්‍රී ලංකාවේ ජනාදරය දිනාගත් ප්‍රමුඛතම මෝල්ට් ආහාරයයි.

**Contact:**

| | | | |
|---|---|---|---|
| Corp. Public Affairs | Damitha Kulatunga | +94777915949 | Damitha.Kulatunga@lk.nestle.com |